Sannasa Sports




මහේල පවසනේ මීළඟ ලෝක කුසලානයට තරග වදින නායකයාට කල් වේලා ඇතිව පළපුරුද්දක් ලබා ගැනීමට අවස්ථාව සළසා දීම සඳහා තමා ඉල්ලා අස් වන බවයි. එහෙත් මීළඟ ලෝක කුසලාන තරගාවලියට කණ්ඩායම මෙහෙයවිය හැකි සාර්ථකම නායකා ඔහු ය යන්න අවිවාදිත ය. ඔහු නායකත්වය ගෙන තරග වැදුණ සෑම අවස්තාවකදීම ඔහු ඒ බව පෙන්වා ඇත.

## ඔහු අපට සිටි සාර්ථක ම නායකයා වන්නේය





# නායකත්වයේ කිරුළ ඉවත දමන මහේල ජයවර්ධන

ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ නායක මහේල ජයවර්ධන නායකත්වයෙන් සමුගන්නා බව පසුගිය දා නිවේදනය කළේ ය. සාමාන්‍යයෙන් නායකයකු නායකත්වයෙන් සමුගන්නේ එම තනතුරේ ඔහු අසාර්ථක වූ විට හෝ වෙනත් ආකාරයක බල අරගලයක ප්‍රතිඵලයක් ලෙස ය. විශේෂයෙන් දේශපාලන ඇඟිලි ගැසීම් හෝ කණ්ඩායම තුළ මතබේධ මතුවීම හෝ නායකත්වයට අභියෝගයක් වන වෙනත් ක්‍රිඩකයකුට අවස්තාව සළසා දීම හෝ මෙවන් තීරණයකට මග පාදන්නට ඉඩ ඇත. නමුත් ශ්‍රී ලංකා ක්‍රිකට් පිටියේ මෙවන් දත්ත්වයක් දකින්නට නැත. මහේල යනු ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයේ බිහි වූ සාර්ථකම නායකයා ය. එවන් නායකයකු හදිසියේ සමුගැනීමට තීරණය කිරීම තිරයෙන් පිටුපස සැඟවුණ වෙනත් යම් බලවේග යක් හේතුවෙන් සිදුවූවාද යන්න අද දවසේ මතුවෙන සැකයකි.

මහේල පවසනේ මීළඟ ලෝක කුසලානයට තරග වදින නායකයාට කල් වේලා ඇතිව පළපුරුද්දක් ලබා ගැනීමට අවස්ථාව සළසා දීම සඳහා තමා ඉල්ලා අස් වන බවයි. එහෙත් මීළඟ ලෝක කුසලාන තරගාවලියට කණ්ඩායම මෙමෙයවිය හැකි සාර්ථකම නායකා ඔහු ය යන්න අවිවාදිත ය. ඔහු නායකත්වය ගෙන තරග වැදුණ සෑම අවස්තාවකදීම ඔහු ඒ බව පෙන්වා ඇත . එපමණක් ද නොවඩ නායකත්වගේ වගකීම් නිසා ඔහුගේ පිති හරඹයේ පසුබෑමක් ඇතැයි කියන්නටද නොහැකි ය. දත්ත වාර්තා පෙන්වා දෙන්නේ ඔහුගේ පිති හරඹයේ ඉහළම සාමාන්‍යය ඇත්තේ නායකයකු ලෙස ක්‍රිඩා කල අවස්ථාවලදී ය යන්නය. පසුගිය වසරේ ලෝක එක්දින කණ්ඩායම අතරින් හොඳම නායකයා ලෙස ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය මගේල තෝරා ගැනීමෙන්ම ඔහුගේ නායකත්වයේ සාර්ථකත්වය මොනවට පැහැදිලි වෙයි.

කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ දස වැනි ටෙස්ට් ක්‍රිකට් නායකයා ලෙස සේවය කළ 33 හැවිරිදි මහේල ගැන සඳහන් නොකරම බැරි කරුණු කීපයක් සටහන් කිරීමට මම කැමැත්තෙමි. නායකයකු ලෙස තම මව්බිමේ ගෞරවයට හානියක් නොවන පරිදි ජාත්‍යන්තරය සමග ඉතා සුහදව කටයුතු කිරීම හා ජාත්‍යන්තර මාධ්‍ය සමග ඉතා සුහදව හා බුද්ධිමත්ව කටයුතු කිරීමේ හැකියාව අතින් මහේල ඉතා ඉහළ තැනක සිටියි. එසේ වුව ද දේශීය මාධ්‍ය සමග ගණුදෙනුවේදී මහේල තරමක් දුරට අසාර්ථක වූ බවද නොලියාම නොහැකි ය. ජනප්‍රියත්වය හඹා යහ තරු හෝ දේශපාලකයන් මෙන් ව්‍යාජ සිනා හා ව්‍යාජ කතා මගින් මාධ්‍ය තුළ කැපී පෙනීමේ ගති ලක්ෂණ මහේල තුළ නොමැති වීම මෙයට හේතු වන්නට ඇතැයි මට සිතෙයි. අඩුවෙන් කතා කිරීම හා කෙළින් කතා කිරීම දේශීය මාධ්‍ය තුළ ජනප්‍රිය වීමට තරම් හේතුවන සාධක නොවේ. දේශපාලනීකරණය වූ ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටුව සමග ඒ තරම් පෑහීමකින් කටයුතු කිරීමට ද මහේලට නොහැකි වූ බව රහසක් නොවේ.

පන්දු යැවීමෙන් මුරලි පිහිටුවන ලද වාර්තා කොපමණ ද. ප්‍රහාරාත්මක පිති හරඹයෙන් සනත් ජයසූරිය ලොව දසත නම රැන්දුවේ ය. එනමුදු මහේල තරම් වාර්තා රැසක් පිහිටවූ ක්‍රිකට් ක්‍රිඩකයකු තවත් නැත . එවන් ක්‍රීඩකයකුගෙන් නායකත්වය ඉවත් කරන්නට යම් නොපෙනෙන බලවේයක් ක්‍රියාත්මක වූවා නම් එවන් බලවේග ඉවත් කර දැමීම ක්‍රිකට් බලධාරීන්ගේ වගකීම හා යුතුකම බව ලියා තබනු කැමැත්තෙමි.

මහේල ගේ වාර්තා පොතින්

- ඕනෑම කඩුල්ලක් සඳහා වැඩිම ලකුණු සම්බන්ධතාව (ලෝක වාර්තාව) කුමාර් සංගක්කාර සමග - ලකුණු 624 (2006 ජූලි 27 - දකුණු අප්‍රිකාවට එරෙහිව කොළඹදී)
- ශ්‍රී ලංකාව වෙනුවෙන් වැඩිම ලකුණු රැස් කළ ක්‍රීඩකයා - ලකුණු 374
- ශ්‍රී ලංකාව වෙනුවෙන් ලබාගත් වැඩිම ලකුණු එකතුව - ලකුණු 8251
- ශ්‍රී ලංකාව වෙනුවෙන් ලබාගත් වැඩිම ශතක සංඛ්‍යාව - ශතක 25
- ශ්‍රී ලංකාව වෙනුවෙන් ලබාගත් වැඩිම උඩපන්දු සංඛ්‍යාව - ටෙස්ට් 144 / එක්දින - 153
- තරඟ දිනීමේ ප්‍රතිශතය - ටෙස්ට් 53% / එක්දින - 60%

අසෝක සිල්වා

## පකිස්ථානයේදී ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රිඩකයන්ට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය

ක්‍රිඩාව යනු දේශපාලනයෙන් තොර මානව උන්නතිය සඳහා කෙරෙන ක්‍රියාදාමයකි. විශේෂයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් යනු මව්බිමේ විවිධ ජාතීන් අතර පවතින සබැඳියාව වඩාත් පිලිබිඹු කරන කැඩපතකි. එතුළ වර්ග බේධයක් හෝ ආගම් බේධයක් හෝ වෙනයම් ආකාරයක බේධයක් හෝ නැත. ශ්‍රී ලංකාවේ සියලුම ජාතීන්ට අයත් ක්‍රීඩකයෝ ශ්‍රී ලංකා කණ්ඩායම තුළ සහෝදරත්වයෙන් අත්වැල් බැඳ ක්‍රීඩා කරති. එවනු වූ ක්‍රිඩා කණ්ඩායමක් ඉලක්ක කර ගනිමින් ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීම අපි තරයේ හෙළා දකිමු.

ආගමික හා වාර්ගික උන්මාදයෙන් අන්ධව සිටින මේ නොමිනිසුන්ගේ ඇස් ඇරෙන්නේ කවදාද?